14-05-2025

ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ...

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

**10 ශ්‍රේණිය අංකය----------------**

## පළමු වාර විභාගය-2025
## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

Learning Resource Center R De Mazenod College Kandana

* සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

**තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

01. ආයතන ප්‍රධානියාගේ **කුඩම්මාගේ සැලකිල්ල** නිසා ඔහු කලකිරී සිටියේය
(1) උසස් තනතුරු නොදීම (2) වෙනස්කම
(3) තත්ත්වයෙන් පහළ දැමීම (4) ගෞරව නොකිරීම

02. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ප්‍රවීණ -දක්ෂ , සමර්ථ, නිපුණ, මුග්ධ
(2) ආනන්දය- සතුට, සතොස ,හර්ෂය, ඔකඳ
(3) තරිඳු- හිමකර, උලිඳු, තාරපති, නිසයුරු
(4) සිරුර- ශරීරය, තුනු, වෙර, කය

03. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මිතුරා- සකි , පිළිමල්, සහෘද, සකිල
(2) විකසිත- ම්ලානික, මුකුලිත, පරවුණු, මැලවුණු
(3) උත්තම -පහත්, අධම , නීච, ම්ලේච්ඡ
(4) අයහපත්- කලණ,සොද,කල්, කල්‍යාණ

04නාසික අක්ෂර හඳුන්වන වෙනත් වචනයක් නොවන්නේ
(1) වර්ගාන්ත (2) අනු නාසික්‍ය (3) අර්ධ අනුනාසික්‍ය (4)නාසික්‍ය

05. සෑම පදයක ම සඤ්ඤක අක්ෂරයක් යෙදී නැති පද පේළිය තෝරන්න
(1) සඳ කිඳුරු, පඬිතුමා, තැඹී, පිඟාන
(2) මඟුල්, දඹදිව, හිඳුවා, ගඟ
(3) නිදි ,දිළිඳු, හැඳි, මෙබඳු
(4) වසඟ, සඳ, කැඳ, දහම් සොඬ

06 පහත දී ඇති වචන අතුරෙන් තෝරන්න
(අ) අපි (ආ) තා (ඇ) මිනිස්සු (ඈ) ළමයා (ඉ) දරුවන්

මෙහි උක්ත පද පමණක් ඇති පිළිතුර තෝරන්න
(1) අ ආ (2) අ ඇ ඈ (3) ආ ඈ ඉ (4) අ ආ ඈ

**07. නිවැරදි නාම ප්‍රකෘතිය වෙන් කොට** ඇති වරණය තෝරන්න
(1) යතුර. (2) බලු. (3) රෙද්ද (4) කන්ද

08 ප්‍රාදේශික ව්‍යවහාරවල අර්ථය වැරදියට දක්වා ඇති පද පේළිය තෝරන්න

(1) කිරි අප්පා -සීයා (2) ඉඟුරු- ඉරිඟු ( 3) හිච්චා -හිටියා (4) සකළයන් -ළමයි

09 පහත දැක්වෙන යුගල පද සම්පූර්ණ කිරීමට අවශ්‍ය පද සම්පූර්ණ කිරීමට අවශ්‍ය පද නිවැරදිව යෙදුණු පිළිතුර තෝරන්න
බාර-----------------, ------------------පාක්කුඩම්,----------------හිලව්,--------------------බුද්ද

(1) භාර, අඩව්, ඉලව්, සුද්ද (2) භාර, පඩුරු, ගණන්, සුද්ද
(3) දුර, පඩුරු, ගණන්, සුද්ද (4) භාර, අඩව්, ගණන්, සද්ද

10 .යමක් කළ හැකි අවස්ථාවේ නොකර පසුව කරන්නට යෑම

(1) ආඳා යවා තබුලා වල්පත ගත්තා සේ (2) පැදුරටත් නොකියා යෑම
(3) ආචාරියා රවටා කැත්ත සෑදුවා වාගේ (4) අනුන්ට හැරූ වළේ තමන් වැටීම

( ලකුණු -10)

ද මැසිනොද් විදුහල, කඳාන
De Mazenod College, Kandana



10 ශ්‍රේණිය අංකය---------------

පළමු වාර විභාගය-2025
සිංහල භාෂාව හා සාහිත්‍යය - II

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අංක (i)සිට (X) තෙක් සියලු ම ප්‍රශ්න සඳහා කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වර්ගාන්ත අක්ෂර දෙකක් ලියන්න.
(ආ) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් කෙටි ස්වර දෙකක් ලියන්න.

(ii)සිංහල හෝඩියේ ඇතුළත්
(ආ) අනුනාසිකය
(ආ) අර්ධ ස්වර අක්ෂරය බැගින් ලියන්න

(iii) පහත දැක්වෙන අක්ෂර භාවිත කරමින් අර්ථවත් වාක්‍ය බැගින් ලියන්න.
(අ) ඝ -
(ආ) ඣ -

(iv) පහත සඳහන් පද වල ප්‍රකෘති ප්‍රත්‍යය වෙන් කරන්න.
(අ) දරුවාගේ
(ආ) ගසින්.

(v) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
අද අප තාක්ෂනික වශයෙන් මනා පදනමක සිටින අතර ජනගහනය විවිධාංගීකරනය වී තිබේ.

(vi)පහත සඳහන් ප්‍රාදේශීක ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාර ලියන්න.
(අ) ගහමප-
(ආ) පුත්තවිච්චා -

(vii)පහත පද වලට විරුද්ධාර්ථවත් පද ලියන්න.
(අ) ආශ්‍රය
(ආ) අනිවාර්ය

(viii)පහත පද වලට සමාන පද පද ලියන්න.
(අ) ප්‍රයත්නය
(ආ) ස්මරණය

(ix) චන්ද -ඡේද යනු යුගල පදයකි. එම වර්ගයට අයත්වන තවත් යුගල පද දෙකක් ලියන්න.
(අ)
(ආ)

(viii)පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන පිරුළු ලියන්න.
(අ) අරමුණකින් තොර ව වැඩ කිරීම
(ආ) පිළිකුලෙන් හෝ නොසැලකිල්ලෙන් සැලකීම

(x) පහත සඳහන් පද යොදා උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි වූ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) විශිෂ්ට -
(ආ) විමර්ශන -

(ලකුණු 02 x 10 = 20)

2. පහත දක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන, වචන 200කට නො අඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක්ද යොදන්න.

(අ) අධ්‍යාපනය යනු පුද්ගලයකු නියෝජනය කරන සමාජ පන්තිය වෙනස් කරන සාධකයකි. එය තමා සිටින තත්ත්වය ඉහළට ඔසවා තැබීමටත් රටට දැයට සේවය කිරීමටත් ලැබෙන මහඟු අවස්ථාවකි. නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල සියල්ලන්ට ම භුක්ති විඳීමට ලැබෙන අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන හොඳින් ඉගෙනීමෙහි නිරත වීම ළමා පරපුරෙහි වගකීමයි.

(ආ) කියවීම සම්පූර්ණ මිනිසකු නිර්මාණය කරයි.යනු කියවීමේ අගය පිළිබිඹු කරන ප්‍රකට අදහසකි. එහෙත් රූපවාහිනි හා අන්තර්ජාලය වැනි නවීන විද්‍යුත් මාධ්‍ය භාවිතය නිසා පාසල් සිසුන්ගේ කියවීමේ පුරුද්ද ශීඝ්‍රයෙන් පහළ බැස ඇති බවට මත පළ වී තිබේ. පාසල් සිසුන්ගේ කියවීමේ රුචිය වර්ධනය කළ හැකි ක්‍රම හා උපාය පිළිබඳ වගකිව යුත්තන්ගේ අවධානය යොමු විය යුතු ය.

(ඉ) පරිගණකය මගින් නූතන සමාජයට සැලසෙන සේවය ඉතා විශාල වේ. පරිගණකය භාවිතයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයන් ද පුළුල් වෙමින් පවතී. මෙරට මෙන් ම විදේශයන්හි ද විවිධ රැකියා සඳහා පරිගණක ඉංජිනේරුවන්ට අවස්ථාව උදා වී ඇත. මේ අතර පරිගණක භාවිතයේ උසස් ප්‍රයෝජන මෙන් ම අපයෝජන ගැන සංවාදයක් ඇති කිරීම අවශ්‍යවේ.

(ඊ) ගගන ගවේෂණ කටයුතුවල යෙදෙන ඇමරිකාවේ නාසා ආයතනය මගින් ලද ආරාධනයකට අනුව අගහරු ගවේෂණ චාරිකාවකට යෑමට මට අවස්ථාව උදා විය. විදෙස් රටක පදිංචි මගේ වයසේ මිතුරන් දෙදෙනෙකු ද මෙම චාරිකාවට සහභාගි විය. එම අත්දැකීමේ චමත්කාරජනක බව මිතුරන්ට පවසන ආකාරය පිළිබඳ නිර්මාණාත්මක කතාවක් ගොඩනගන්න .(ලකුණු 20 යි)

3. පහත දක්වෙන පාඨය වචන 35-40 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග ලියන්න.

වර්තමාන සංවර්ධන ක්‍රියාවලියේ දී උපරිම අන්දමින් සම්පත් පරිහරණය කෙරේ. භෞතික සම්පත් වේගයෙන් ක්ෂය වන බැවින් අනාගත පරම්පරාවට ඒවා පරිහරණය කිරීමට අවස්ථාවක් නොලැබෙනු ඇත. ඒ නිසා සම්පත් භාවිතය අරපිරිමැස්මෙන් කළ යුතු ය. මේ අදහස ධරණීය සංවර්ධනය සංකල්පයට අන්තර්ගත වී ඇත. වර්තමාන අවශ්‍යතා ඉටු කර ගනිමින් අනාගත පරම්පරාවේ අවශ්‍යතා සඳහා ද සම්පත් පරිහරණය කිරීමේ අවශ්‍යතාවක් ලබා දීම ඉන් අදහස් කෙරේ.
මේ අනුව කටයුතු කිරීම අවශ්‍ය ය. ජනතාව වෙනුවෙන් ලබා දෙන පහසුකම්වල දී සම්පත් සංරක්ෂණය සඳහා ජනතා සහභාගීත්වය බිඳී ගොස් ඇත. නළ ජලය අපතේ හැරීම මෙයට හොඳ උදාහරණයකි. එවැනි අවස්ථාවලින් වැළකී සිටීමටත් අන් අය ඒවායින් වළක්වාලීමත් තුළින් සම්පත් සංරක්ෂණය ක්‍රියාවලියට පහසුවෙන් අපට දායක විය හැකි ය. සංවර්ධනය වෙමින් පවතින රටක ඉදිරි සංවර්ධන සැලසුම් සකස් කිරීමේ දී දේශීය සම්පත් ප්‍රයෝජනයට ගත හැකි අයුරින් සැලසුම් කිරීම වැදගත් ය.

(ලකුණු 10යි)

4. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.

මිනිස් හඬ වා රැළ තවත් නැත
සුනිල් වන පෙත නුවන සනහන
අඩක් කාලයේ පසට යටවුණු
ඇහැටු පැළ පෙඳ පාසි උසුලන
සියක් වස් කොපමණ ද
නොඳනිමි මලක් පහනක් දිටියෙ පුදසුන

කිළිටි රා දොස් මෝ මුළායෙන්
රුධිර රා දොස් මෝ මුළායෙන්
රුධිර පවසැති මිනිස් අතකින්
කඩා රැස් කළ කුසුම් කුමට ද
කුමන පලය ද කිළිටි බතකින්
පිදීමට මාගේ අවිහිංසාවාදී පියාණන්
වියළි පතකින්, ඇහැටු පෙඳ පාසියෙන් බැරි ඇයි?

(i) මෙහි කියැවෙන පුදබිම පිහිටි පරිසරයේ ලක්ෂණයක් ලියන්න.
(ii) පුදසුනේ කොපමණ කාලයක් මල් පහන් පූජා කොට නැති ද ?
(iii) කවියා පලක් නැති ලෙස දකින්නේ කෙබඳු පූජා භාණ්ඩ ද?
(iv) පූජා කිරීම සඳහා කවියා යෝජනා කරන්නේ කවර දේ ද?
(v) පද්‍යයේ සඳහන් "රා" පදයේ අර්ථය පහදන්න.

(ලකුණු 5 යි)

5. නගරයෙන් මදක් ඈතින් පිහිටා ඇති පොල්ගස්ගම ගමේ පවුල 200ක් පමණ ජීවත් වෙති. මෙහි වැසියන්ට ඇති ගැටලුවක් වන්නේ අවුරුදු පහට අඩු දරුවන් සඳහා විධිමත් පෙර පාසලක් නොමැති වීමයි. පාසල් අධ්‍යාපනය සඳහා පෙරහුරුවක ලබා ගැනීමටත්, සමවයස් කණ්ඩායම් සමග කෙළිදොළෙන් ගත කිරීමටත්, තම දරුවන් පුරුදු පුහුණු කිරීමටත් ඔවුහු අපේක්ෂා කරති.

මේ සඳහා ප්‍රදේශයේ දානපතියෙක් ඉඩම් කැබැල්ලක් පරිත්‍යාග කිරීමට ඉදිරිපත් වී සිටී. මේ සියලු කරුණු සඳහන් කරමින් ඔවුන්ගේ අවශ්‍යතාව දන්වමින් ප්‍රදේශීය සභාවේ ළමා කටයුතු අංශයභාර සභාපතිවරයා වෙත යවන රාජකාරි ලිපිය ලියන්න. ඔබ පොල්ගස්ගම ගමේ සුබසාධක සංගමයේ දම්මික බණ්ඩාර යැයි සිතන්න.

(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය)

නැතහොත්

ගම්පහ "අරුණලු" යොවුන් සමාජය මගින් පවත්වන "ප්‍රතිභා ප්‍රභා" සිත්තම් උළෙළ 2025 .04. 29 දින ගම්පහ නගරසභා ශාලාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම සිත්තම් උළෙළ නැරඹීම සඳහා පැමිණෙන්නැයි ආරාධනා කරමින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත යවන ආරාධනා පත්‍රය සකස් කරන්න. ඔබ ඇරුණලු යොවුන් සමාජයේ ලේකම් යැයි සිතන්න.

(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15 යි)

14-05-2025

ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ...

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

10 ශ්‍රේණිය අංකය---------------

## පළමු වාර විභාගය-2025
## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1සිට 10 තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

01. (අ) ගුත්තිල කාව්‍ය රචනා වූයේ කිනම් සාහිත්‍ය යුගයක ද?
(ආ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කළේ කවුරුන් ද?

02. (අ) ගුත්තිල කාව්‍ය රචනා කළ රාජ සමය සඳහන් කරන්න
(ආ) ගුත්තිල කාව්‍ය රචනා කළ කතුවරයාගේ නම සඳහන් කරන්න

03.(අ) ගුත්තිල කාව්‍යයේ බෝසත් චරිතය කුමන නමකින් හැඳින්වේ ද
(ආ) ගුත්තිල කාව්‍යයේ අන්තර්ගත පද්‍ය සංඛ්‍යාව සඳහන් කරන්න

04. (අ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමේ අරමුණ සඳහන් කරන්න
(අ) ගුත්තිල කාවයේ ආරම්භක කවිය රචනා වූ කාව්‍ය ගණය සඳහන් කරන්න

05. (අ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට මූලාශ්‍ර වූ ජාතක කතාව කුමක් ද?
(ආ) ගුත්තිල වාසය කළ නුවර සඳහන් කරන්න

06. **පටන්** සුරිඳු දුන් උපදෙස් සිහි කොට
**ඉටන්** බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
.................................................
.................................................

(අ) මෙම කවියේ ඉතිරි පාද සම්පූර්ණ කරන්න
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද දෙකේ අර්ථ වෙන වෙන ම දක්වන්න

07. රුති වනපෙතිනැ'විදින් සුමුවෝ යා
නිති මියුරැති වෙණ නාදළමුවෝ යා
.................................................
තැති නොගනිති මිනිසුන් සමුවෝ යා

(අ) මේ කවියේ තුන්වන පාදය සම්පූර්ණ කරන්න.
(ආ) 'සමූහ වශයෙන්' හා 'සම්මුඛයේ' යන අර්ථ සහිත වචන දෙක පිළිවෙළින් උපුටා ලියන්න.

08. පියසන් නො ව බිඟු දැල රැඳි කොපුලී
අවසන් නො ව වෙණ නදට ම කුහුලී
.................................................
ගජසෙන් සිතියම් ගජසිරි කියෙලී

(අ) මේ කවියේ තුන්වන පාදය සම්පූර්ණ කරන්න.
(ආ) ගුත්තිල මුසිල වීණා වාදනයේ උච්චතම අවස්ථාවේ ඇතුන් හැසිරුණ ආකාරය ඉහත කවිය ආශ්‍රයෙන් සඳහන් කරන්න.

09 නො දැන ම තමා බල
සබයට ඇවිත් නො පැකිළ
වැඳ රද පද **කමල**
දෙසෙක මුසිලයා ද උන් කල

(අ) මුසිල වාසය කළ නුවර සඳහන් කරන්න
(ආ) මෙම කවියේ රූපකාලංකාරය සඳහන් කරන්න

Learning Resource Center R De Mazenod College Kandana

10 කන් කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දැල් කොලහල වන බියෙනේ
සත් සල නොව එහි පිළිරු ලෙසිනේ.
නත් හය සෙන් සිටියෝ සිටි මතිනේ

(අ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට මූලාශ්‍ර වූ ජාතක කතාව කුමක් ද
(ආ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට පාදක වූ ජාතක කතාව සඳහන් කරන්න

(ලකුණු- 10 )

- පහත ප්‍රශ්නවලින් එකක් තෝරා ලියන්න.( වචන 120 පමණ විය යුතු ය. )

(01) ගුත්තිල කාව්‍යයේ අසිරිමත් සුරඟන වැනුමකි නිදසුන් තුනක් දක්වමින් සනාථ කරන්න

(02) ගුත්තිල කාව්‍ය තුළින් ගුත්තිල ඇඳුරු තුමාගේ වීණා වාදනයේ දක්ෂතාවය කියා පාන්නේ ඊට සවන් දුන් පිරිස හැසිරුණු ආකාරයෙනි. නිදසුන් තුනක් ඇසුරෙන් විමසන්න.

(03) අර්ථය සහ ශබ්දය මනාව සංකලනය කිරීම ගුත්තිල කාව්‍ය රසවත් නිර්මාණයක් වීමට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ තුනක් දක්වමින් විමසන්න.

(ලකුණු . 10)